රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 02/94

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1994.01.10 වන දින.

සියළුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,

තාවකාලික අනියම් ආදේශක සේවකයින්ට හා අභ්‍යාසලාභීන්ට
<u>ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම.</u>

1993.09.27 දින හා අංක 23/93 දරණ ඉහත කරුණ සම්බන්ධයෙන් වූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මෙයින් අවලංගු කරනු ලබන අතර ඒ වෙනුවට මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වනු ඇත.

02. තාවකාලික, අනියම් හා ආදේශක සේවකයින්ට ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද 1993.06.17 හා අංක 14/93 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන පහත සඳහන් පරිදි ක්‍රියාත්මක කෙරේ.

03. ලිපිකරු හා ආශ්‍රිත ශ්‍රේණිවලට බඳවා ගැනීමේදී අනියම් තාවකාලික හා ආදේශක සේවකයින්ට අනුග්‍රාහක ලකුණු ලබා දීම 1993 මැයි 09 වන දින සිට ක්‍රියාත්මක වනු ඇත. එබැවින් 1993.05.09 වන දිනට පෙර පුරප්පාඩු පිරවීම සඳහා ඉල්ලුම්පත් කැඳවා එදිනට එම පුරප්පාඩු නොපුරවන ලද සහ 1993.05.09 දින හෝ ඊට පසු ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද එම ශ්‍රේණිවල තනතුරු වලට බඳවා ගැනීමේදී අනුග්‍රාහක ලකුණු ලබා දිය යුතුය.

04. මෙම අනුග්‍රහය 1992.04.01 දින හෝ ඊට පෙර සේවයේ යොදවා ගන්නා ලද සහ 1993.05.09 දිනට ලිපිකාර හා සමාන්තර ශ්‍රේණිවල සේවය කළ 1993.05.09 දින හෝ ඉන් පසු ඔවුන් සේවයේ සිටීම හෝ නොසිටීම නොසලකා ලබා දෙනු ඇත.

05. 1993.06.13 හා අංක. 14/93 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් අනියම්, තාවකාලික හා ආදේශක සේවකයින්ට ලබා දෙන ලද අනුග්‍රහය එම චක්‍රලේඛයේ කොන්දේසි සපුරා ඇති සියලුම අභ්‍යාසලාභීන්ට ද ලබා දෙනු ඇත.

06. 1993.07.01 දින සිට රාජ්‍ය ආයතන වලට අනුයුක්ත කර ඇති හා ඉදිරියෙහි අනුයුක්ත කරනු ලබන අභ්‍යාසලාභීන්ගේ පුහුණු කාලය වසරක කාලයක් සඳහා සීමා කළ යුතු අතර තවදුරටත් දීර්ඝ නොකළ යුතුය. 1992.04.01 සිට 1993.06.30 දක්වා රාජ්‍ය ආයතන වලට අනුයුක්ත කරන ලද අභ්‍යාසලාභීන්ට දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ අභිමතය පරිදි 1994.06.30 දක්වා තවදුරටත් පුහුණුවක් ලබා දිය හැකිය. මෙම සීමාව ඉංජිනේරු හා වෙනත් සමාන්තර කාර්මික ක්ෂෙත්‍රවල අභ්‍යාසලාභීන්ට අදාළ නොවනු ඇත.

අ.කලේ/වයි.බී.පුස්සෙදෙනිය
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.